**විසර්ජන ශීර්ෂය - 184 - පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යාංශය**

**විගණකාධිපති වාර්තාව - 2012 වර්ෂය**

1.1 විගණන විෂය පථය

පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යාංශයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 ජූලි 11 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැළසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

1.3 විගණන නිරීක්ෂණ

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4

සිට 1.9 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

මු.රෙ.477 ඡේදය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වැය ලෙජරය යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.

(ආ) විසර්ජන ගිණුම

(i) මුළු ප්‍රතිපාදනය හා වියදම

සමාලෝචිත වර්ෂය සඳහා අමාත්‍යාංශය සඳහා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.729,050,000 ක් වූ අතර, වර්ෂය අවසාන වන විට ඉන් රු.301,382,309 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ඉතිරිවීම් රු.427,667,691 ක් වී තිබුණු අතර, එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 58.66 ක් ගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2012 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| පුනරාවර්තන | 479,000,000 | 481,275,000 | 246,093,737 | 51.13 |
| මූලධන | 229,000,000 | 247,775,000 | 181,573,954 | 73.28 |

| | | | |
|---|---|---|---|
| එකතුව | 708,000,000 | 729,050,000 | 427,667,691 |
| | ========= | ======== | ========= |

(ඇ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම්

පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

විෂය අංක 18401 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 1,800,000 | 669,708 | 600,000 | 778,823 | 5,500,000 | (109,115) |

1.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

1.4.1 සංයුක්ත සැළැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානින්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානින් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැළැස්මක් අමාත්‍යාංශය විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළයුතු වුවත්, එම සැළැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

1.4.2 වාර්ෂික කාර්ය සාධන වාර්තා

ඉහත 1.4.1 ඡේදයෙහි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය පරිදි 2002 සැප්තැම්බර් 12 හා 2004 පෙබරවාරි 20 දින දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ 402 හා 402(1) ප්‍රකාර මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත අමාත්‍යාංශය විසින් පිළියෙල කළයුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාළ කාර්ය සාධන වාර්තාව 2013 ජුනි 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

1.4.3 වාර්ෂික ප්‍රසම්පාදන සැළැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැළැස්ම පිළියෙල කර තිබුණේ 2012 ජුලි 31 දිනදීය.

1.5 වත්කම් කළමනාකරණය

(අ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම

ආයතනයක් සතු වාහනයක් පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යාංශයේ කටයුතු සඳහා භාවිතා කරනු ලැබුවද 2012 දෙසැම්බර් 31 වන විටත් එම වාහනයේ අයිතිය විධිමත්ව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද අමාත්‍යාංශයට අයත් නොවන වෙනත් වාහන දෙකක් මෙම අමාත්‍යාංශය යටතේ පවතින අතර, ඒවා විධිමත් පරිදි පවරා ගැනීමට හෝ එම වාහන අයත් අමාත්‍යාංශවලට භාරදීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ආ) බේරුම් නොකළ බැරකම්

අමාත්‍යාංශය විසින් 2012 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.5,204,903 ක් වූ අතර, ඒවා වර්ෂයකට වඩා අඩු කාලයක් තුල වූ ශේෂයක් විය.

(i) 2013 වර්ෂයේ මුල් මාස 03 හි වවුචර් පරීක්ෂාවේදී 2012 වර්ෂයට අදාළව 2013 වර්ෂයේදී ගෙවන ලද එකතුව රු.75,726 ක් වූ බැරකම් අයිතම 05 ක් විසර්ජන ගිණුමේ බැරකම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි.

(ii) මු.රෙ.94(1) ප්‍රකාරව වෙනත් ආකාරයකට විධිවිධාන සළස්වා ඇති අවස්ථාවලදී හැර වාර්ෂික ඇස්තමේන්තුවල ඒ සඳහා මුදල් ප්‍රතිපාදන ඇත්නම් මිස කිසිම දෙපාර්තමේන්තුවක් විසින් වැඩක් හෝ සේවයක් හෝ සැපයුමක් සඳහා කිසිම වියදමකට හෝ බැදීමකට හෝ නොබැඳී සිටිය යුතු අතර, ඒ වෙනුවෙන් දරන බැරකම් සහ වැය ප්‍රමාණය කිසිම විටෙක මුදල් වර්ෂය සඳහා ප්‍රතිපාදිත මුදල් නොඉක්ම වියයුතු වුවත් වැය විෂයයන් 14 කට අදාළව රු.3,859,841කින් ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට බැඳී තිබුණි.

1.6 නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

2009 ජුනි 17 දිනැති අංක 19/2009(1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2(1) ඡේදය ප්‍රකාර අමාත්‍ය කාර්ය මණ්ඩලය, අමාත්‍යාංශ ලේකම්වරුන්, ආයතන ප්‍රධානීන් ඇතුළු සියළුම රාජ්‍ය සේවකයින් තම සේවා ස්ථානයේ පැමිණීම හා පිටවීම ඇඟිලි සළකුණු සටහන් කිරීමේ යන්ත්‍ර මගින් සනාථ කිරීම කළයුතු වුවද, පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යාංශයේ අමාත්‍ය කාර්ය මණ්ඩලයේ නිලධාරින් ඇඟිලි සළකුණු යන්ත්‍ර භාවිතා කර නොතිබුණි.

1.7 කාර්ය සාධනය

(අ) සැළසුම් කිරීම

(i) වාර්ෂික ක්‍රියාකාරී සැළැස්මට අනුකූලව ක්‍රියා නොකිරීම

පහත සඳහන් අවස්ථාවලදී ක්‍රියාකාරී සැළැස්මට අනුකූලව ක්‍රියා කර නොතිබුණි.

- පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යාංශය විසින් 2012 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැළැස්මක් පිළියෙල කර තිබුණද එම ඉලක්කයන් කරා ළඟා වීමට අපොහොසත් වී තිබුණි.

- 2012 වර්ෂය තුල බස් නැවතුම්පළ 04 ක් ඉදිකිරීම සඳහා ඉලක්කගත කර තිබුණද, බස් නැවතුම්පළ 07 ක් ඉදිකිරීම් සඳහා කටයුතු ආරම්භ කර තිබුණි. එහෙත් 2013 අගෝස්තු 31 දින වන විට බස් නැවතුම්පළ 03 ක් පමණක් ඉදිකිරීම් නිමකර විවෘත කිරීමට පියවර ගෙන තිබුණි.

- නිලධාරීන් 33 දෙනකු සමාලෝචිත වර්ෂයේ දෙවන කාර්තුව අවසාන වනවිට පුහුණු කිරීමට ඉලක්ක ගත කොට තිබුණද, වර්ෂය අවසාන වන විට කිසිදු නිලධාරියෙක් පුහුණු කර නොතිබුණි.
- දුරගමන් සේවා මගී විවේකගත ස්ථාන 02 ක් (මහඔය හා වාකරේ) ඉදිකිරීම සඳහා ඉලක්කගත කොට තිබුණද, එම ස්ථාන දෙකෙහි මූලික වැඩකටයුතු පමණක් ආරම්භ කර තිබුණි.

## 1.8 කළමනාකරණ දුර්වලතා

-----------------------------

පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යාංශයේ අමාත්‍යාවරයා ඇතුළු කාර්ය මණ්ඩලය සඳහා වාහන 08 ක් වෙන්කර තිබියදීත්, සංචිත වාහනයක් අමාත්‍යාවරයාගේ මාධ්‍ය අංශය වෙත අනුයුක්ත කර තිබුණ අතර, ඒ සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු.312,470 ක මුදලක් ඉන්ධන සඳහා පමණක් ගෙවා තිබුණි.

## 1.9 මානව සම්පත් කළමනාකරණය

------------------------------------

අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

---------------------------------------------------

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 08 | 06 | 02 | - |
| (ii) | තෘතියික මට්ටම | 01 | - | 01 | - |
| (iii) | ද්විතියික මට්ටම | 34 | 20 | 14 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 15 | 14 | 01 | - |
| (v) | වෙනත් (අනියම්/තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | 02 | - | 02 |
| (vi) | අමාත්‍ය කාර්ය මණ්ඩලය | 15 | 15 | | |
| | එකතුව | 73 | 57 | 18 | 02 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 18ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.